කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග
සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
கமத்தொழில், கிராமிய பொருளாதார அலுவல்கள் ,
நீர்ப்பாசனம், மீன்பிடி மற்றும் நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு
Ministry of Agriculture, Rural Economic Affairs, Irrigation
and Fisheries and Aquatic Resources Development

(කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)

නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | MA/ICTU/3-ANC-1 | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2019.10.10 |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
සියළුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු
සියළුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරු

## මධ්‍යගත කෘෂිකාර්මික දත්ත පද්ධතිය සකස් කිරීම

ශ්‍රී ලංකාව හා රාජ්‍ය 68ක් සමඟ අත්සන් කොට ඇති **OGP (Open Government Partnership)** ගිවිසුමට අනුව සහ අමාත්‍ය මණ්ඩලය මඟින් අනුමත කර ප්‍රකාශයට පත් කොට ඇති ශ්‍රී ලංකාවේ ආර්ථික ඩිජිටල්කරණය වැඩසටහන **2019.03.01** සිට **2021.08.31**දක්වා සකස් කිරීම අත්‍යවශ්‍ය කාරණයකි.

එහිදී ගොවි ජනතාව වෙත නිවැරදි දත්ත ලබා දෙමින් කෘෂිකාර්මික ආර්ථිකය ශක්තිමත් කිරීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇති අතර එහි මූලික පියවර වශයෙන් ගොවි ජනතාවගේ ඉඩම් පිළිබඳ හා ඔවුන්ගේ නිෂ්පාදන හා වෙළඳපොල පිළිබඳ දත්ත රැස් කොට ඒවා සංවිධානාත්මක ලෙස ගබඩා කොට විශ්ලේෂණය කොට අර්ථකථනය කිරීම සඳහා කටයුතු සලසා ලීම මෙම අමාත්‍යාංශය විසින් කළ යුතුව ඇත. ඒ සඳහා වන මූලික අඩියර වශයෙන් කුඹුරු පිළිබඳ දත්ත ලබා ගැනීම ගම්පහ දිස්ත්‍රික්කයෙන්ද, එළවලු පලතුරු පිළිබඳ දත්ත ලබා ගැනීම බදුල්ල දිස්ත්‍රික්කයෙන්ද, ආරම්භ කොට ඇත.

මෙම තොරතුරු මඟින් ගොවීන්, රජයේ නිලධාරීන්, යෙදවුම් සැපයුම්කරුවන්, කෘෂිකර්මය මත පදනම් වූ ක්‍රියාකරුවන් හා කෘෂි අලෙවිකරණ ආයතන සඳහා ප්‍රතිලාභ ලබා දීම අපේක්ෂාව වේ. මෙහිදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දායකත්වය ඇතිව අදාළ දිස්ත්‍රික්ක දෙකෙහි ගොවීන්ගේ හා ගොවි බිම් පිළිබඳව දත්ත රැස්කිරීමේ කාර්යය සිදුකරමින් පවතී. මෙම දත්ත ලබා ගැනීමේ කාර්යයේ දී කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සහ ග්‍රාම නිලධාරීන් ඔවුන්ගේ දායකත්වය සෘජුවම ලබා දෙන අතර මෙම කාර්ය වඩාත් සාර්ථකව සහ කාර්යක්ෂමව දිස්ත්‍රික්කය තුළ සිදුකරගෙන යාම සඳහා ඉහත නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ, දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර ගොවිජන කොමසාරිස්වරුන්ගේ, ගොවිජන සේවා මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ, සංවර්ධන නිලධාරීන්ගේ සහ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සාමූහික දායකත්වය ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙනී යයි. ඒ හෙයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2879048; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2863497
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2868910

- දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ දායකත්වය

  1. අවශ්‍ය කටයුතු හා පහසුකම් ලබාදීම සඳහා අමාත්‍යාංශය හා ව්‍යාපෘති නිළධාරීන් සමඟ සම්බන්ධීකරණයට අවශ්‍ය උපදෙස් ලබා දීම.
  2. තම දිස්ත්‍රික්කයට අදාළ වන දත්ත හා තොරතුරු අවශ්‍ය පරිදි සපයාදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් හට අවශ්‍ය උපදෙස් ලබා දීම.

- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දායකත්වය

  1. තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ වන දත්ත හා තොරතුරු අවශ්‍ය පරිදි සපයාදීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
  2. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදීමට ගොවිජන සේවා දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම.

- දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය

  1. දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී අවශ්‍ය සහය ලබාදීම.

- ගොවිජන සේවා දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ගේ දායකත්වය

  1. අවශ්‍ය කටයුතු හා පහසුකම් ලබා දීම සඳහා අමාත්‍යාංශය හා ව්‍යාපෘති නිළධාරීන් සමඟ සම්බන්ධීකරණය.
  2. තම දිස්ත්‍රික්කයට අදාළ වන දත්ත හා තොරතුරු අවශ්‍ය පරිදි සපයාදීම.
  3. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ගොවිජන සේවා ස්ථානභාර නිලධාරීන් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් දැනුවත් කිරීම.
  4. දී ඇති කාලසීමාව තුළදී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර දීම.
  5. සෑම කන්නයකදිම දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දීම.

- ප්‍රාදේශීය ගොවිජන සේවා ස්ථානභාර නිලධාරීන්ගේ දායකත්වය

  1. දත්ත පද්ධතිය සඳහා දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය.
  2. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්, ව්‍යාපෘතියේ නිලධාරීන් සම්බන්ධීකරණය.
  3. සෑම කන්නයකදිම දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දීම.

- සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වය

    1. දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී අවශ්‍ය සහය ලබාදීම

- කෘෂිකර්ම උපදේශකවරුන්ගේ දායකත්වය

    1. දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලියේ දී අවශ්‍ය සහය ලබාදීම

- ග්‍රාම නිලධාරී මහත්ම/මහත්මීන්ගේ දායකත්වය

    1. ජාතික හැඳුනුම්පත් අංක නොමැති පුද්ගලයන් සඳහා එම අංක ලබා දීමට අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍ය සහයෝගය ලබා දීම.
    2. ගොවි පවුල් වල සාමාජිකයන් පිලිබඳ තොරතුරු ලබා දීම.
    3. ගොඩ ඉඩම් නාමලේඛන පරිගණක ගත කිරීමේදී අවශ්‍ය සහයෝගය ලබා දීම.

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ දායකත්වය

    1. ගොවියන් පිළිබඳ තොරතුරු සැපයීම.
    2. ගොවිබිම් පිළිබඳ තොරතුරු සැපයීම.
    3. ගොවිබිම් සිතියම්ගත කිරිම සඳහා ඉඩම් හඳුනා ගැනීමට සහය වීම හා අනෙකුත් අවශ්‍යවන තොරතුරු සැපයීම.
    4. සෑම කන්නයකදිම දත්ත පද්ධතිය යාවත්කාලින කිරීම .

ඉහත දායකත්වය ලබා දෙමින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට අවශ්‍ය සහය දක්වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර
ලේකම්
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

පිටපත : සියළුම පළාත් ලේකම්වරු - කා.දැ.ස